කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් සංවර්ධනය කිරීම උදෙසා පහසුකම් සැපයීමේ ව්‍යාපෘතිය -2013

---

කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් සංවර්ධනය කිරීම උදෙසා පහසුකම් සැපයීමේ ව්‍යාපෘතියේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ජාත්‍යන්තර සංවර්ධන සංගමය (ජා.සං.ස) සහ ශ්‍රී ලංකා රජය (ශ්‍රී ලං‍ර) අතර 2010 නොවැම්බර් 08 දින එළඹි අංක 4804 එල්කේ දරන ණය ගිවිසුමේ උපලේඛන 2 හි 11 ආ 3 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් සංවර්ධනය කිරීම උදෙසා පහසුකම් සැපයීමේ ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවන නියෝජිතායතනය වන අතර, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ සම්බන්ධීකරණය මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය මගින් සිදු කෙරේ. ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණ වනුයේ, ගෝලීය මූල්‍ය අර්බුදය මගින් බලපෑමට ලක් වූ ශ්‍රී ලංකාවේ කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් සඳහා කෙටි කාලීන මූල්‍යනය ඇතුලත් මූල්‍යනය ප්‍රවේශය වැඩි දියුණු කිරීමයි.

ව්‍යාපෘතිය පහත සඳහන් කොටස්වලින් සමන්විත වේ.

(අ) මුදල් යෙදවීම සහ අවදානම බෙදා ගැනීම

---

(i) කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා උප ව්‍යාපෘති ණය සැපයීම අරමුණු කරගෙන සහභාගිත්ව මූල්‍ය ආයතනයන් සඳහා ණය මාලාවන් සංවිධානය කිරීම තුලින් එවැනි ව්‍යවසායන් සඳහා ඵලදායි ආයෝජනයන් පවත්වා ගෙන යාම.

(ii) සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් ආරම්භ කරනු ලබන සහ පවත්වා ගෙන යන කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසාය උප ව්‍යාපෘති ණය කළඹවලට අදාලව අවදානම් බෙදා ගැනීමේ පහසුකම් ඇති කිරීම තුළින් කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා ප්‍රවේශය සහ කෙටි කාලීන මූල්‍යනය පුළුල් කිරීම.

(ආ) කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසාය බැංකු ව්‍යාපාර සඳහා ප්‍රතිපත්ති සහ ධාරිතාවය ප්‍රසාරණය කිරීම

---

(i) කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායන්වල මුදල් යෙදවීමට අදාලව සහභාගීත්ව මූල්‍ය ආයතනවල සහ එවැනි මුදල් යෙදවීම්වල ඵලදායි උපයෝජනය හා සම්බන්ධව එවැනි ව්‍යවසායන්වල ධාරිතාවය වර්ධනය කිරීම.

(ii) සීමාවන් හා මිණුම් හඳුනාගැනීමේ සහ එවැනි සීමාවන්වලට ආමන්ත්‍රණය කරමින් සීමාවන් විනිශ්චය කිරීමක් ඉටු කිරීම ඇතුළත් කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායන්වල මුදල් යෙදවීම සඳහා හැකියාව ඇති පරිසරය ශක්තිමත් කිරීම.

(iii) පරිපාලනමය සහ මූල්‍ය කළමනාකරණය, ප්‍රසම්පාදනය සහ වියපැහැදම් කිරීම ඇතුලත් ව්‍යාපෘති කළමනාකරණයට, ක්‍රියාත්මක කිරිමට, නියාමනයට සහ ඇගයීමට සහාය සැපයීම.

ණය ගිවිසුමට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය වි.ගැ.හි (SDR) 37,800,000 කට සමාන රු.මිලියන 6,455.77 ක් මූල්‍යනය කිරීමට ජාත්‍යන්තර සංවර්ධන සංගමය (ජා.සං.ස) එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2010 මැයි 01 ආරම්භ කර 2014 මාර්තු 31 වනවිට නිම කිරීමට නියමව තිබුණු අතර පසුව ව්‍යාපෘති කාලය 2015 සැප්තැම්බර් 30 දින දක්වා දීර්ඝ කර තිබුණි.

සංරචක අනුව ව්‍යාපෘති අරමුදල් මූල්‍යනය පිළිබඳ විස්තර පහත දැක්වේ.

| සංරචකය | මූල්‍යනය | |
|---|---|---|
| --------- | ------------ | |
| | එ.ජ.ඩො.මිලියන | රු.මිලියන |
| | ----------------- | ----------------- |
| සංරචකය 1 | | |
| ------------- | | |
| මුදල් යෙදවීම හා අවදානම බෙදා ගැනීමේ පහසුකම | | |
| (අ) ණය ප්‍රමාණය | 28 | 3,149.16 |
| (ආ) අවදානම බෙදා ගැනීමේ පහසුකම | 13 | 1,462.11 |
| සංරචකය 2 | | |
| ------------- | | |
| කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසාය බැංකු ව්‍යාපාර සඳහා ප්‍රතිපත්ති සහ ධාරිතාවය පුළුල් කිරිම | | |
| (අ) කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායන්වල සහ ණය ලබාදීමේ ආයතනවල ධාරිතාවය වර්ධනය කිරිම | 7 | 787.29 |

| | | | |
|---|---|---|---|
| (ආ) | කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායන්වල මුදල් යෙදවීම සඳහා හැකියාව ඇති පරිසරය ශක්තිමත් කිරිමට උපකාර කිරිම | 1 | 112.47 |
| (ඇ) | ව්‍යාපෘති කළමනාකරණ ඒකකයට සහායන් සැපයීම | 4 | 449.88 |
| | වෙන් නොකළ අරමුදල් | 4.4 | 494.86 |
| | | ------- | ---------- |
| | එකතුව | 57.4 | 6,455.77 |
| | | ==== | ======= |

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරිම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරිමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරිම, ක්‍රියාත්මක කිරිම සහ පවත්වාගෙන යාමත්, යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරාගැනීම සහ යොදාගැනීමත්, අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරිමත් මෙම වගකීමට ඇතුලත් වේ.

2. විගණන විෂය පථය සහ මතය සඳහා පදනම

---

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළහැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාරී වන සාක්ෂි නියැදි පදනම මත පරීක්ෂා කිරීම්, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිමේදී කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හා වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ උපරිම දැනීම හා විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිළි කිරීම් මා විසින් ලබා ගන්නා ලදී . ඒ අනුව මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ

විගණනය මගින් සපයන බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීම පිණිස අවශ්‍ය යැයි සලකනු ලැබූ පද්ධති හා පාලන, ගනුදෙනු, වත්කම්, වගකීම් හා ගිණුම් වාර්තා පිළිබඳ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාල පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ශ්‍රී ලංකා රජයෙන් සහ ණය මුදල් සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම්වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණය යටතේ මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඇ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදු කර තිබුණේද යන බව.

(ඈ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ, ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඉ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයන්ට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනාගෙන තිබුණේද යන බව.

(ඊ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(උ) විශේෂ (ඩොලර්) ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂය, එම ආපසු ගැනීම් හා එම ගිණුමට ඌන පූර්ණය කිරීම්, ව්‍යාපෘතිය විසින් පවත්වා තිබුණු පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රී ලං ම බැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඌ) ණය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව.

(එ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

3. මතය

-------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිළි කිරීම් අනුව මෙම වාර්තාවේ 5 ඡේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගත වන ගැලපීම්වලින් ඇතිවන බලපෑම හැර, මාගේ මතය වනුයේ,

(අ) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2013 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) විශේෂ (ඩොලර්) ගිණුමේ ආරම්භක ශේෂය හා අවසාන ශේෂය, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුල එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌන පූරණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව සහ 2013 දෙසැම්බර් 31 දිනට වූ ශේෂය, එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඈ) ණය ගිවිසුමෙහි නියම කර ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව සහ

(ඉ) පසුගිය වසරේ විගණන වාර්තාවෙන් පෙන්වා දුන් ප්‍රධාන කරුණු නිවැරදි කිරීම සඳහා සතුටුදායක පියවර කළමනාකරණය විසින් ගෙන ඇති බව සහ

(ඊ) ණය ගිවිසුමෙහි දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

4. මූල්‍ය ප්‍රකාශන

----------------

4.1 මූල්‍ය කාර්ය සාධනය

------------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතියේ වියදම රු.637,663,360 ක් වූ අතර, 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම රු.3,053,472,299 ක් විය. සමාලෝචිත වර්ෂයේ වියදම හා 2012 වර්ෂයේ වියදම සහ 2013 දෙසැම්බර් 31 දින සමුච්චිත වියදම පිළිබඳ සාරාංශයක් පහත ප්‍රකාශයෙන් දැක්වේ.

| විස්තරය | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම | | 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම |
|---|---|---|---|
| ----------- | ------------------------------------- | | -------------------- |
| | 2013 | 2012 | |
| | රු. | රු. | රු. |
| ස්ථාවර වත්කම් | 303,806 | 415,416 | 15,711,564 |
| උපණය ප්‍රදානයන් සඳහා සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත ඇති අරමුදල් | 612,070,270 | 1,521,446,408 | 2,951,978,018 |
| මෙහෙයුම් වියදම් | 13,416,171 | 11,929,939 | 52,627,464 |
| සහභාගීත්ව මූල්‍ය ආයතනවල නිලධාරීන් පුහුණුව සහ සංවර්ධනය | 11,668,557 | 17,533,657 | 32,995,697 |
| ව්‍යාපෘති මෙහෙයුම් ඒකකය මඟින් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් පුහුණු කිරීම | 159,556 | - | 159,556 |
| | ----------------- | ----------------- | -------------------- |
| | 637,663,360 | 1,551,325,620 | 3,053,472,299 |
| | ========= | ========== | =========== |

4.2 විශේෂ (ඩොලර්) ගිණුම

-------------------------

ව්‍යාපෘතිය විසින් පවත්වා තිබුණු පොත්පත්වලට හා ලබා ගත හැකි වූ තොරතුරුවලට අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පවත්වාගෙන යනු ලැබූ ඩොලර් ගිණුමේ මෙහෙයුම් සාරාංශ කර පහත දැක්වේ.

| | එ.ජ.ඩො. | රු. |
|---|---|---|
| | ---------- | ---------- |
| 2013 ජනවාරි 01 දිනට ශේෂය | 10,226,827 | 1,300,451,518 |
| එකතුකළා<br>---------- | | |
| ප්‍රතිපූරණය කිරීම් | 5,403,861 | 708,731,685 |
| විදේශ විනිමය වාසිය | - | 20,975,967 |
| | -------------- | ---------------- |

| | | |
|---|---|---|
| | 15,630,688 | 2,030,159,170 |
| අඩු කළා<br>--------- | | |
| ආපසු ගැනීම් | 4,956,349 | 634,457,367 |
| | -------------- | ------------------ |
| 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය | 10,674,339 | 1,395,701,803 |
| | ======== | ========== |

5. විගණන නිරීක්ෂණ

----------------------

5.1 නීතිරීති රෙගුලාසි හා කළමනාකරණ තීරණ යනාදියට අනුකූල නොවීම

------------------------------------------------------------------------

මෙම ව්‍යාපෘතිය මඟින් අනුග්‍රහය දක්වන සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාවසායකවල ක්‍රියාකාරකම් තුළින් පරිසරයට සිදුවන බලපෑම පිළිබඳ සම්පූර්ණ විගණනයක් සිදු කර වාර්තාවක් සපයන ලෙස විදේශ දූත මණ්ඩලය මඟින් උපදෙස් දී තිබුණද 2013 දෙසැම්බර් 31 දින දක්වාම සුදුසු විශේෂඥයෙකු සොයා ගැනීමේ අපහසුතාවය මත එවැනි පරිසර විගණනයක් සිදු කර නොතිබුණි.

6. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

--------------------------------

6.1 අරමුදල් උපයෝජනය

-------------------------

සමාලෝචිත වර්ෂයේ හා 2013 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍යනය, අයවැය ප්‍රතිපාදනය සහ අරමුදල් උපයෝජනය සම්බන්ධ වැදගත් සංඛ්‍යාලේඛන සමහරක් පහත දැක්වේ.

| | ණය ගිවිසුම අනුව මූල්‍යනය කිරීමට එකඟවී තිබූ වටිනාකම | | 2013 වර්ෂය සඳහා අයවැය ප්‍රතිපාදනය | සමාලෝචිත වර්ෂය තුළ උපයෝජනය කරන ලද මුදල | 2013 දෙසැම්බර් 31 දිනට උපයෝජනය කරන ලද මුදල |
|---|---|---|---|---|---|
| | ඇ.එ.ඩො මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| ජා.සං.ස | 57 | 6,456 | 900 | 638 | 3,053 |

| | | | | | |
|---|---|---|---|---|---|
| ශ්‍රී ලංරෑ | නැත | නැත | 8 | 8 | 27 |
| | ------------- | ------------- | ------------- | ------------- | ------------- |
| | 57 | 6,456 | 908 | 646 | 3,080 |
| | ======== | ======== | ======== | ======== | ======== |

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

(i) ණය ගිවිසුම අනුව අවදානම බෙදා හැරීම සඳහා එ.ජ. ඩො. මිලියන 13 කට සමාන රු. මිලියන 1,462 ක් හෙවත් ණය ගිවිසුම මඟින් එකඟ වූ මුදලින් සියයට 23 ක් වෙන් කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම එම මුදල් උපයෝජනය කර නොතිබුණි.

(ii) එ.ජ.ඩො.මිලියන 01 කට සමාන රු. මිලියන 112 ක් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ගේ යෙදවුම් ප්‍රාග්ධනයට හිතකර වාතාවරණයක් ඇති කිරීම වෙනුවෙන් ප්‍රතිපාදන කර තිබුණද එම අරමුණ ලඟා කර ගැනීම සඳහා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

6.2 සහභාගීත්ව මූල්‍ය ආයතන මඟින් ණය නිදහස් කිරීම සම්බන්ධයෙන් පැනනගින කරුණු

---

ව්‍යාපෘතිය මඟින් ඉදිරිපත් කර තිබූ ප්‍රගති වාර්තාව අනුව ණය අනුමත කරන ලද සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සංඛ්‍යාව, සහභාගීත්ව මූල්‍යායතන මඟින් අනුමත ණය මුදල, නිදහස් කරන ලද ණය මුදල, ව්‍යවසායකයෙකු වෙනුවෙන් අනුමත කරන ලද සාමාන්‍ය ණය මුදල පහත දැක්වේ.

| සහභාගීත්ව මූල්‍යායතනයේ නම | ණය අනුමත කරන ලද සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සංඛ්‍යාව | සහභාගීත්ව මූල්‍යායතන මඟින් අනුමත කළ ණය මුදල | 2013 දෙසැම්බර් 31 දිනට නිදහස් කරන ලද ණය මුදල | ව්‍යවසායකයෙකු වෙනුවෙන් අනුමත කරන ලද සාමාන්‍ය ණය මුදල |
|---|---|---|---|---|
| | සංඛ්‍යාව | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| ලංකා බැංකුව | 64 | 493 | 439 | 7.7 |
| මහජන බැංකුව | 68 | 360 | 323 | 5.3 |
| කොමර්ෂල් බැංකුව | 80 | 524 | 504 | 6.5 |
| ඩීඑෆ්සීසී බැංකුව | 26 | 366 | 364 | 14.1 |
| ජාතික සංවර්ධන බැංකුව | 21 | 352 | 335 | 16.8 |
| ප්‍රාදේශීය සංවර්ධන බැංකුව | 88 | 315 | 245 | 3.6 |
| හැටන් නැෂනල් බැංකුව | 18 | 330 | 322 | 18.3 |

| | | | | |
|---|---|---|---|---|
| සම්පත් බැංකුව | 49 | 419 | 420 | 8.55 |
| | --------- | ---------- | --------- | --------- |
| | 414 | 3,159 | 2,952 | 7.63 |
| | ====== | ===== | ===== | ===== |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) පෞද්ගලික බැංකු මඟින් ව්‍යවසායකයෙකුට අනුමත කරන ලද සහ ප්‍රදානය කරන ලද සාමාන්‍ය ණය මුදල රාජ්‍ය බැංකු මඟින් අනුමත කරන ලද සාමාන්‍ය ණය මුදලට වඩා ඉහළ අගයන් ගෙන තිබුණි. මේ අනුව රාජ්‍ය බැංකු මඟින් වැඩි සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් ප්‍රමාණයකට සහයෝගය දැක්වීම තුලින් සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ගේ සත්‍ය අවශ්‍යතා හඳුනාගෙන ඔවුන් නඟා සිටුවීම සඳහා කටයුතු කර තිබුණු බව මෙයින් ඇඟවේ.

(ii) ලැබුණු තොරතුරු අනුව සමාලෝචිත වර්ෂය තුල සහභාගීත්ව මූල්‍යායතන මඟින් ආයෝජකයන් 7,647 කට පුහුණු වැඩමුළු පවත්වා තිබුණු නමුත් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් 3,159 කට පමණක් ණය ප්‍රදානය කර තිබුණි.

(iii) ලැබුණු තොරතුරු අනුව සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් විසින් පිරිමි 254 කට හා කාන්තාවන් 1,396 කට රැකියා අවස්ථා ජනිත කිරිමට අපේක්ෂිතව තිබුණි. කෙසේ වුවද අපේක්ෂිත අරමුණ ඉටු කරගෙන තිබුණේද යන්න පරීක්ෂා කිරිම සඳහා ප්‍රමාණවත් තොරතුරු ව්‍යාපෘති මෙහෙයුම් ඒකකය විසින් පවත්වාගෙන ගොස් නොතිබුණි.

(iv) ණය අනුමත කර මාස 06 ක් තුල පළමු වාරිකය නිදහස් කිරිමට සියළුම සහභාගීත්ව මූල්‍යායතන මඟින් එකඟ වී තිබුණද එකතු වටිනාකම රු. මිලියන 26.5 ක් වූ ණය මුදල් 02 ක් 2013 දෙසැම්බර් 31 දින දක්වාම නිදහස් කර ගෙන නොතිබුණ බැවින් මෙම ව්‍යවසායකයන්ට ණය අනුමත කර වර්ෂයකුත් මාස 10 ක කාලයක් ගත වී තිබුණද ණය නිදහස් කර නොතිබුණි.

6.3 සහභාගීත්ව මූල්‍ය ආයතනවල හා ව්‍යවසායකයන්ගේ කාර්යය මණ්ඩල ධාරිතාවය වර්ධනය කිරිම තුලින් පැනනගින කරුණු

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යාපෘතියේ සංරචක අංක 2 යටතේ ණයදෙන ආයතන හා ව්‍යවසායකයින්ගේ ධාරිතාව වර්ධනය කිරිම සඳහා පුහුණු වැඩසටහන් පවත්වා සහභාගීත්ව මූල්‍ය ආයතනවල සේවකයන් 5,580 ක් හා ව්‍යවසායකයන් 7,890 ක් එම වැඩසටහන්වලට සහභාගී වී තිබුණි. ලබා ගත් තොරතුරු අනුව සහභාගීත්ව මූල්‍ය ආයතනවල සේවකයෙකු පුහුණු කිරිම සඳහා රු. 4,188 ක සමාන්‍ය පිරිවැයක් හා සුළු හා මධ්‍ය පරිමාණ ආයෝජකයන් පුහුණු කිරිම සඳහා රු. 1,213 ක සාමානය පිරිවැයක් දරා තිබුණද සමාලෝචිත වර්ෂය

තුල සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් 414 දෙනෙකුට පමණක් ණය අනුමත කර තිබුණි.

(ආ) 2013 නොවැම්බර් 06 දින ජාත්‍යන්තර සංවර්ධන සංගමයේ නියෝජිතයන් පිරිසක් විසින් සිදු කරන ලද ක්ෂේත්‍ර පරීක්ෂණයකට අනුව මෙම ව්‍යාපෘතියේ ප්‍රතිලාභීන්ට තම ව්‍යාපාරවල සාමාන්‍ය පරිපාලනය හා තාක්ෂණික දැනුම පිලිබඳ වැඩිදුර පුහුණුව අවශ්‍ය වී තිබූ බව අනාවරණය වී තිබුණද ව්‍යාපෘති මෙහෙයුම් ඒකක මගින් ධාරිතා වර්ධනය සඳහා ප්‍රතිපාදනය කර තිබුණ රු. මිලියන 427 න් රු. මිලියන 33 ක් පමණක් සමාලෝචිත වර්ෂය අවසාන වන විට උපයෝජනය කර තිබුණි.

(ඇ) නිලධාරියෙකු පුහුණු කිරිම සඳහා දැරූ පිරිවැය හා ව්‍යවසායකයෙකු පුහුණු කිරිම සඳහා දැරූ පිරිවැය සැලකිය යුතු ලෙස වෙනස් වී තිබුණු බව නිරීක්ෂණය විය. ලංකා බැංකුව මඟින් බැංකු නිලධාරියෙකු පුහුණු කිරිමේ අඩුම පුහුණු පිරිවැය දරා තිබුණු අතර එය එක් බැංකු නිලධාරියෙකු සඳහා රු.1,096 ක් වූ අතර හැටන් නැෂනල් බැංකුව වැඩිම පිරිවැයක් දරා තිබුණි. එය එක් බැංකු නිලධාරියෙකු සඳහා රු. 19,002 ක් විය. ව්‍යවසායකයෙකු පුහුණු කිරිම සඳහා වූ රු. 498 ක අවම පිරිවැය කොමර්ෂල් බැංකුව විසින් දරා තිබූ අතර සම්පත් බැංකුව මඟින් වැඩිම පිරිවැය වූ රු. 3,032 ක් දරා තිබුණි. මේ අනුව පුහුණුව සඳහා අන්තර්ගත කරුණු හා ප්‍රයෝජනයට ගෙන තිබූ සම්පත්වල සියලු සහභාගීත්ව මූල්‍ය ආයතන අතර සැලකිය යුතු අසමානතාවයක් තිබූ බව නිරීක්ෂණය විය.

6.4 අයවිය යුතු ණය හා පොළිවලට අදාල අවදානම බෙදා හැරීම තුලින් පැනනගින කරුණු
------------------------------------------------------------------------------------------------

ණය ගිවිසුමේ " ඉ " වගන්තිය අනුව ණය හා පොළී ආපසු අය වීමේ අවදානම සමනය කිරිම සඳහා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සමඟ අවදානම බෙදා හැරීමට කටයුතු කළයුතු වුවද නිදහස් කර තිබූ රු. මිලියන 1,462 ක් වූ ණයවලට අදාලව 2013 දෙසැම්බර් 31 දින දක්වාම අවදානම බෙදා හැරීමට අදාලව කිසිදු කටයුත්තක් සිදු කර නොතිබුණි.

6.5 සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ට සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් අනුමත කරන ලද ණයවලට අදාල පොළී අය කිරිම හා අවදානම බෙදා හැරීම තුලින් පැනනගින කරුණු
------------------------------------------------------------------------------------------------------

ව්‍යාපෘතිය විසින් සහභාගීත්ව මූල්‍යායතන සමඟ ඇති කර ගෙන තිබූ ගිවිසුමේ "ජේ" වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා මහ බැංකුව මඟින් අර්ධ වාර්ෂිකව ප්‍රකාශයට පත් කරනු ලබන සාමාන්‍ය ස්ථාවර තැන්පතු පොළිය පදනම් කර ගෙන ණය පොළි නිශ්චය කල යුතුය.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ශ්‍රී ලංකා මහ බැංකුවේ අර්ධ වාර්ෂික සාමාන්‍ය ස්ථාවර තැන්පතු පොළී අනුපාතය යොදා ගැනීම වෙනුවට සහභාගීත්ව මූල්‍ය ආයතන මඟින් සියයට 8.69 සිට සියයට 15.93 ක් වූ විවිධ පොළී අනුපාත සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ගේ ණය ශේෂ මත අය කර ගෙන තිබුණි. ව්‍යාපෘතිය මඟින් සියළුම සහභාගීත්ව මූල්‍යායතන මඟින් අය කල යුතු පොළී අනුපාතය නියම කිරිමට කටයුතු කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ii) සමාලෝචිත වර්ෂය තුල ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සමඟ අවදානම බෙදා හැරීමේ පහසුකම් පිලියෙල කර නොතිබුණ නිසා ප්‍රතිලාභින්ට අවදානම සඳහා වූ දායකත්වය සමඟ ඉහළ පොළී අනුපාතය තුල අන්තර්ගත අවදානම් සංරචකය සමඟ ගෙවීමට සිදු වී තිබුණි. තවද අවදානම බෙදා හැරීමේ පහසුකම් කාලානුකූලව ක්‍රියාවේ යොදවා තිබුණි නම් සමාලෝචිත වර්ෂය තුල ණය ලබාගෙන තිබූ ප්‍රතිලාභින්ගෙන් අය කරන සියයට 14.88 ක පොළී අනුපාතය ඉන් භාගයක් දක්වා වූ පොළී අනුපාතයකට අඩු කර ගත හැකිව තිබුණු බව නිරීක්ෂණය විය.